**බුද්ධශාසන අරමුදල - 2016**
**--------------------------------**

බුද්ධශාසන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------------**

1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12(1) වගන්තිය අනුව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016 වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම**
**---------------------------------------------**

අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් සහ ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම**
**--------------------------------------------------**

2017 දෙසැම්බර් 13 දිනැති අංක සීඒඑස්/ඩී/බීඑස්එෆ්/16/06 දරන ලිපියෙන් විගණනය සඳහා ඉල්ලා සිටි 2016 වර්ෂයේ ආදායම් වියදම් හා තැන්පත් මුදල් සම්බන්ධ තොරතුරු 2018 මාර්තු 31 දින දක්වාම විගණනය වෙත ලබා දී නොතිබුණි.

**2.4 වත්කම් හා වගකීම්වල පැවැත්ම**
**-------------------------------------**

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දක්වේ.

| **වත්කම්** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 10,571,873 |
| ආයෝජන | 483,124,346 |
| බුද්ධජයන්ති කාසි | 317,400 |
| බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 12,896,049 |
| අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු මුදල් | 13,024,546 |
| ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් | 6,047,086 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පත් සඳහා ලැබිය යුතු පොලී | 621,863 |
| සාමණේර කැපකරු ව්‍යාපෘතිය - ලැබිය යුතු ආයෝජන පොලී | 301,096 |
| සමූපකාර අලෙවි සංවර්ධන තැන්පත් | 4,270 |
| රාජකීය ආසියාතික සංගමය | 7,282 |
| ලැබිය යුතු පොලී - ජාතික ඉතිරි කිරීමේ බැංකුව (රඳවාගත් බදු) | 605,352 |
| **මුදල් හා බැංකු** | |
| ශ්‍රී ලංකා මහ බැංකුව | 2,956,630 |
| ලංකා බැංකුව | 94,156 |
| **ජංගම වගකීම්** | |
| ගෙවිය යුතු සාමනේර දීමනා | 612,500 |
| පාලිටීකා සිංහලට පරිවර්තනය සඳහා ගෙවිය යුතු මුදල | 544,409 |
| 2600 years of budduism ග්‍රන්ථය සඳහා කතෘන් වෙනුවෙන් ගෙවිය යුතු මුදල | 1,168,025 |
| **මුළු ආදායම** | 34,403,622 |
| **මුළු වියදම** | 6,458,049 |
| **අතිරික්තය** | 27,945,573 |

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 8 (ආ) වගන්තිය. | ආයෝජනවලින් ලැබෙන ආදායම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත කර ඇති ජංගම ගිණුමට බැරකළ යුතු වුවත් එම ආදායම් අදාල ගිණුමට බැර කිරීමෙන් තොරව නැවත ආයෝජනය කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |

| | |
|---|---|
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් අරමුදල විසින් බැංකු සැසඳුම් සකස් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756, 757 හා 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.2 (ඇ) ඡේදය. | බැංකු ගිණුම් පොත්පත් නිතිපතා සසදා කාර්තු වශයෙන් වාර්තා සකස් කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**2.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදලට ලැබී තිබූ මුළු පරිත්‍යාග මුදලින් සියයට 85 ක් එනම් රු.70,596,618 ක් පෞද්ගලික මූල්‍ය සමාගමකින් ලැබී තිබුණි. එම මුදල් පරිත්‍යාග කළ අයගේ අවශ්‍යතාවයට අනුව බුද්ධශාසන අරමුදල විසින්, විහාර සංවර්ධන සමිතියක් මගින් කළුතර මතුගම ප්‍රදේශයේ සිදු කරන බුදු පිළිම නෙලීමේ කටයුත්තක් සඳහා බටමුල්ල කන්ද බෞද්ධ මධ්‍යස්ථානයේ දායක සභාව වෙත මුදාහැර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අරමුදල මැදිහත් වී නොතිබුණු අතර පරිත්‍යාග කරන ලද සමාගම විසින්ම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදුකර තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 9 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එයින් ව්‍යාපෘති 5 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ඉටුකරන ලද එම කාර්යයන් ද මුළු වර්ෂයටම අදාළව ඉටුකිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ මාස 3 ට අදාළව කැපකරු ශිෂ්‍යාධාර ගෙවා නොතිබුණි.

(ii) සාමණේර ආයතන 16 ක් සඳහා මාස 192 කට අදාළව ගෙවීම් කළ යුතු වුවද මාස 111 ක කාලයකට අදාළව පමණක් ගෙවීම් කර තිබුණි.

(iii) වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජිවිතය සම්බන්ධ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් 06 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද වැඩසටහන් 3 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ රු.25,696,736 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණද එයින් සියයට 26 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැය කර තිබුණු අතර රු.13,970,109 ක් නිෂ්කාර්යව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල වෙනුවෙන් වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කර නොගැනීම හේතුවෙන් මනා වැඩ බෙදීමක් හා අභ්‍යන්තර පාලනයක් සිදුවන පරිදි වැඩ පැවරීමට නොහැකි වී තිබුණි.

(ආ) බුද්ධශාසන අරමුදලේ ලේකම් හා ගණකාධිකාරි තනතුර සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ පූජා භූමි අධ්‍යක්ෂක හා ප්‍රධාන ගණකාධිකාරි වැඩ බැලීමේ නිලධාරීන් ලෙස පත් කර තිබූ අතර අරමුදල සඳහා අනුයුක්ත කර තිබූ නිලධාරීන්ගේ කාර්යයන් ඔවුන් අතින් නිරන්තර අධීක්ෂණයට ලක් නොවීම නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

------------------------------------------

## 4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

අරමුදල වෙනුවෙන් වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අදාල රේඛීය අමාත්‍යාංශය මගින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.2 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2016 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ වලට අනුව, ක්‍රියාකාරී සැලැස්මේ අදාළ සංශෝධනයන් සිදු කර නොතිබුණි.

## 4.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 පරිදි අරමුදලේ අරමුණුවලට අනුකූලව අයවැය ලේඛනයක් සකස් කර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන, ඒ අනුව වියදම් දැරිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.